# කර්මය හා නිරය සංකල්පය ඇසුරින් තුලනාත්මක අධ්‍යයනයක් (බෞද්ධ හා ඉස්ලාම් ආගම ඇසුරින්)

**අයි.ඒ. සකිලා බානු[1]**

## හැඳින්වීම

මිනිස් මනස තුළ ආගම නම් සංකල්පය මුල් බැසගත් දින පටන් ම කර්මය හා විපාකය පිළිබඳ විශ්වාසයට ද ප්‍රධාන තැනක් හිමි විණි. පුද්ගල පැවැත්ම සම්බන්ධයෙන් බලපෑම් ගෙනදුන් නිශ්පුද්ගල බලවේගයක් වන කර්මයට මුල්වන චේතනාව කෙරෙන් සිදුවන යහපත් හා අයහපත් ක්‍රියා නිසා මරණින් මතු සුගතිගාමී හා දුගතිගාමී උත්පත්තීන් ලබන බවට විවිධ ආගම් උගන්වයි. කර්මය හා නිරය පිළිබඳ විමසන විට සිදුකරන ලද අකුසල කර්මයන්ට අනුරූපී විපාකයන් දැක්වීමේ දී මානව කේන්ද්‍රවාදී හා දේවකේන්ද්‍රවාදී ආගම් තුළ කර්මය හා නිරය පිළිබද සංකල්පය විවිධ ආකාරයෙන් සාකච්ඡාවට ලක් වී ඇත.

මෙහි දී සංකල්පයක් වශයෙන් බුදු දහම තුළ 'කර්මය හා නිරය සංකල්පය' ලෙසත් ඉස්ලාම් ආගමේ 'ඉබාදත් හා නාර්' යන වදන් කෙරෙනුත් එය නිරූපණය වෙයි. බුදු දහම තුළ චේතනාව මුල් කොටගත් හැසිරීම් (චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි) කෙරෙන් සිදුවන කුසලාකුසල කර්මයන් කෙරෙන් ඊට අනුරූපී උත්පත්තීන් ඇතිවන බව ද ඉස්ලාම් ආගම අනුව නම් දෙවියන් වහන්සේ විසින් දක්වන ලද ඉබාදත් (මුස්ලිම්වරයෙකු සතු විය යුතු ඇවතුම්) ක්‍රියාවන්හි යෙදීම නොයෙදීම මත අවසන් විනිශ්චය දිනයේ දී විපාකයන් ලබන බව ද දක්වාලනු ලබයි. බුදු දහම තුළ විවිධ ලක්ෂණයන්ගෙන් යුත් අපාය තලයන් දක්වන අතර ඉස්ලාමීය විග්‍රහයන් තුළ ද එබඳු ලක්ෂණ විද්‍යාමාන වෙයි. මෙලෙස බුදු දහම තුළ හේතුඵලවාදය කෙරෙන් ද ඉස්ලාම් ආගම තුළ දේවකේන්ද්‍රවාදය කෙරෙන් ද මෙම සංකල්ප කර්මය, විපාකය, සංසාරය, නිරය හා එහි තලයන් ඇසුරින් පොදුවේ ඉගැන්වෙයි. එම සංකල්ප තුලනාත්මකව අධ්‍යයනය කළ හැකි ද යන පර්යේෂණ ගැටලුව පාදක කරගනිමින් යථෝක්ත පර්යේෂණය සිදුකිරීමට අපේක්ෂිත ය. ශාස්ත්‍රීය ලෝකය තුළ එබඳු තුලනාත්මක අධ්‍යයනයක් සිදුවී නොතිබීමේ අඩුපාඩුව ඌන පූරණය කිරීමට උක්ත ශාස්ත්‍රීය ප්‍රයත්නයෙන් අපේක්ෂා කෙරේ.

## පර්යේෂණ ක්‍රමවේදය

තුලනාත්මක සාමයික සංකල්ප අධ්‍යයනයක් මත පදනම් වන පර්යේෂණයක් බැවින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරමින් ආගම් ද්විත්ත්වය හා සම්බන්ධ

1. පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.
imtiazbanu93@gmail.com

තෝරාගත් ප්‍රාථමික, ද්විතීයික, තෘතියික මූලාශ්‍රය අධ්‍යයනය කිරීමටත් අවශ්‍ය වූ විටෙක විෂය පිළිබඳ ප්‍රාමාණික දැනුමකින් යුතු විද්වතුන් හා සාකච්ඡා කිරීමටත් අපේක්ෂා කෙරේ.

**සාකච්ඡාව**

උච්ඡේදවාදය තුළ දී මරණයෙන් සියල්ල කෙළවර වන බවට අදහස් දැක්වූවත් මරණය වනාහි ඇතැම් ආගම්වලට අනුව කර්මඵල ලැබීමේ ප්‍රවේශයකි. ඇතැම් ආගම්වලට අනුව සදාතනික කර්මඵලලාභී දිවියකට ප්‍රවේශවීමකි. මෙහි දී බෞද්ධ විග්‍රහය ගත් කළ චේතනා පූර්වක කායික, මානසික හා වාචසික ක්‍රියා කර්ම නමින් අදහස් කරන බව පැහැදිලි වෙයි. කර්ම ශක්තීන් මත ඒ ඒ නිරයන්හි සත්ත්වයෝ උපදිති. එසේ ඉපදීමට ඉවහල්වන කර්මය හඳුන්වා ඇත්තේ 'ජනක කර්මය' නමිනි. ජනක කර්මයෙන් උපන් සත්ත්වයාට උපකාර වන්නේ 'උපත්ථම්භක කර්මයයි.' ඔහුට පීඩාගෙන දෙන කර්ම 'උපපීඩක කර්ම' හා ජනක කර්මයේ ශක්තිය සපුරා ඝාතනය කිරීම 'උපඝාතක කර්ම' නමින් අර්ථ දැක්වේ. කෙසේ නමුදු අකුසල කර්මයන්ගේ ප්‍රබලත්වය මත මුහුණදීමට සිදුවන විවිධ විපාක, විවිධ අපාය තලයන් බුදුසමය තුළ දැක්වේ. පාප කර්මයන් කළවුන් උපදින අටමහා නරකය ඒ අතර සුවිශේෂී වෙයි. සංජීවක, කාලසුත්ත, සංඝාතය, රෞරවය, මහාරෞරවය, තාප, ප්‍රතාප, අවීචි යන නරකයන් එහි ලා දැක්වෙයි.

අපායෙහි ස්වභාවය දැක්වීමේ දී ලෝභ ආදී කොට ඇති සිතිවිලි මුල්කොට ගෙන සිදු කරන ලද කර්ම හේතුවෙන් ඉක්බිති නිරයන්හි උපදී. ඒ ඒ කර්මයන් අනුව උපදින්නාවූ නිරයන්හි ස්වභාවය මජ්ඣිම නිකායේ සුඤ්ඤත වග්ගයේ දේවදූත සූත්‍රයේ දැක්වේ. ඊට අනුව කර්මානුරූපීව නිරයන්හි පුද්ගලයා උපදින බව දැක්වෙයි. එසේ උපදින දුගති නම් නිරය, තිරශ්චාන, ප්‍රේත වශයෙනි. අයෝමය භූමියක ඇවිලගත් ගින්නෙන් හා අන්ධකාරයෙන් යුතු නිරයෙහි විවිධාකාරයෙන් නිරිසතුන් කර්මවිපාක විඳින බව දැක්වෙයි.

''චතුක්කණ්ණො චතු ද්වාරො විභත්තො භාගසො මිතො,

අයොපාකාරපරියන්තො අයසා පටිකුජ්ජිතො.

තස්ස අයොමයා භූමි ජලිතා තෙජසා යුතා,

සමන්තා යොජනසතං ඵරිත්වා තිට්ඨති සබ්බදා'' (ම.නි. තෘතීයඃ භාගය, 2006ඃ 392)

යනුවෙන් දොරටු සතරකින් යුතු අයෝමය භූමිය ඇවිලගත් ගිනිදළුවලින් යුක්ත ය. සැමදා හාත්පස ගිනි, යොදුන් සියයක පැතිර තියෙන බව දැක්වෙයි. ඉන් පසුව ඇති ගූථ නිරයෙහි උපන්නන් දැඩි දත් ඇති පණුවන් විසින් සම්, මස් නහර, ඇට විද ඇට මිදුළු කා දමයි. ඊට සමාන්තර උණු අළු නිරයෙහි දැඩි දුක් විඳිති. එසේ ම කුක්කුල නම් විසල් කටු හා ගිනි ඇති හිඹුල් වනය, අසිපත්‍ර වනය ආදී කොට කර්ම ක්ෂය වනතාක් නොමැරෙන ස්වභාවයක් දැක්වෙයි. ඉක්බිති වේතරණී නම් ලවණ රසැති නදියට වැටෙන සත්වයින් ගිනිගෙන දිලිසෙන යකඩ අඬුවලින් ගිනියම් ලෝහගුලි හා ලෝ දියෙන් යමපල්ලන්ගෙන් සංග්‍රහ විඳිනු ලැබ වේදනාවට පත්වන බව දැක්වෙයි.

ඉස්ලාම් ආගමට අනුව මියයන පුද්ගලයා අජ්බුද්දනබ් නම් සියුම් පදාර්ථයක් කෙරෙන් අවසන් විනිශ්චය දිනයේ උත්ථානය (බර්සක්) කොට අවසන් විනිශ්චයට පමුණුවනු ලැබෙයි. එදින සෙසු දිනයන්ට වඩා වෙනස් ස්වභාවයක් ගනියි. අවසන්

විනිශ්චය සිදුවීමට ආසන්නයේ දී සූර්යයා පොළොවට ඉතා සමීපයේ පිහිටයි. කුසල් - අකුසල් විනිශ්චය මහා යාඥාවෙන් පසුව සිදුකරනු ලබන අතර මෙහි දී 'මීසාන්' නම් තරාදියෙන් මිනිසුන්ගේ හොඳ - නරක කිරා මැන බලනු ලැබේ. කුසල් පැත්ත බරවූවන් ස්වර්ගයට හිමිකම් කියන අතර අකුසල් පැත්තට වැඩි බරක් සහිතවූවන් නිරයට යොමුකෙරේ.

විනිශ්චයෙන් අනතුරුව භෞතික සිරුරෙන් යුතු සියලු ආත්මයෝ සිරාත් පාලමෙන් විමුක්තිය සොයා ගමන් ගන්නා විට නිරයේ ජීවිතය නියම කරනු ලැබූවන් අසිපත් තුඩක් තරමට සිහින් වී ගිය පාළමෙන් යා නොහැකිව අඳුරු අගාධයකට ඇදවැටී ගිනිදැල් හා උණු දියෙන් යුතු නිරයෙහි සදාතනික දුක්ඛයන් උරුමකර ගනිති. පව් කළ මුඃමින්වරුන් (විශ්වාසීන්) පාපයන් මත නිරයට යොමු කෙරෙන අතර එම පාපයන්ට අදාළ විපාක ලැබීමෙන් පසුව ඔවුනට ස්වර්ගය නියම කරනු ලැබෙයි. එනමුදු කාෆිර්වරුන්ට (අවිශ්වාසීන්ට) නිරයම සදාකාලික උරුමයක් වන අතර මරණයක් නැත. නිරයන් ගත් කළ ජහන්නම්, ලලා, හුතමා, සඊර්, සකර්, ජහීම්, හාවියා වශයෙන් ප්‍රභේද වෙයි. මුනාෆික්වරු පහළම තට්ටුවේ ගිල්වනු ලබන අතර නිරයෙහි අඩුම වේදනාව වන්නේ, ගින්දරවලින් පාවහන් දෙකක් පළඳවනු ලැබීමයි. එයින් ඔහුගේ මොළය රත්වන බව පැවසේ.

ඉස්ලාමයේ දැක්වෙන නිරය සඳහා ප්‍රවේශ වන්නේත් තෘෂ්ණා පරවශභාවය කෙරෙන් ම ය. සූරත් - අල් - ලයිල් හි සඳහන් වන ආකාරයට ''කවරෙක් මසුරුකම් කර (පරමාධිපතිගෙන් වෙන් වී) තමා ස්වයං පෝෂිත යැ'යි සිතා කටයුතු කරන්නේ ද, තව ද මෙම යහපත් දේ බොරු යයි පැවසුවේ ද, අප ඔහුව අපහසුව ගෙන දෙන නිරය කරාවූ මාර්ගයට පහසුකම් සළසන්නෙමු'' (අල් කුර්ආන්, 2014: 1150) යනුවෙන් දැක්වෙයි.

ඉතා ගැඹුරු වූ සියලු වේදනාවන් දෙනු ලබන නිරයෙහි මිය යාමක් නැත. අකුසල් ක්ෂය වනතුරු පුද්ගලයා නැවත නැවත උපදියි. ගින්නෙන් තෙල් සම දක්වා ද අස්ථි දක්වා ද පිළිස්සී ගිය ද දරුණු ගෝනුසු, සර්ප ආදී සත්වයින් පෙළනු ලැබුවේ වුව ද නැවත නැවතත් ඔහු ප්‍රකෘති ස්වභාවයෙන් ම විපාක විඳින්නට උපදී. මොවුන්ට දෙන ආහාරවලින් කුස නොපිරේ. ඒවා හුදු තිත්ත කටු පඳුරු පමණි (අල් කුර්ආන්, 2014: 1133). ලෝදියෙන් ද ලෝහමය ගුලි ගිල්වීමෙන් ද පාපයන්ට අදාළ දඬුවම් ලැබෙයි. කුරාණයට අනුව ගින්දරවලින් සිරුරට වේදනාදෙන විට ඉවසාගත නොහැකිව ළතැවෙති. පැන දිවීමට ද නොහැකි ය. නිරයේ ගින්නෙන් දැවෙන විට රියන් හැත්තෑවක් දිග යදමින් ඔවුහු බැඳ දමති. ඔහු දැවෙන්නේ ලෞකික ආශාව නම් බුර බුරා නැගෙන ගිනි දැල්ලෙනි (අහමද්, 2008 : 115).

බුදු සමයට අනුව කර්මඵල විපාකය ඇදහීම අනිවාර්යය ලක්ෂණයක් වන අතර සෑම මරණයකින් පසුව ම කර්මඵල විපාක පවත්නා තුරු සත්වයාගේ සසර ප්‍රවර්තනය සිදු වේ. ඉස්ලාමයට අනුව මරණය ජීවිතයේ අවසානය නොවන බවට මිනිසා තරයේ ඇදහිය යුතු ය. මරණින් මතු ස්ථිර ජීවිතයක් ඇත. අවසාන වශයෙන් යමෙක් විශ්වාසයෙන් හා කීකරුකමෙන් ලැබෙන ආනිසංස හා දුසිල්වත් බවින් ලබන විපාක දැනගැනීමට මරණින් මතු දැනීම පවත්වාගත යුතු බවත් එය විශ්වාසකොට යුතු කාරණාවන්ගෙන් වැදගත් එකක් බවත් දක්වා ඇත. මෙලෙස බුදු දහම හා ඉස්ලාම්

ආගම තුළ කර්මය හා නිරය හෙවත් නාර් සංකල්පය පිළිබඳ සම විසම විග්‍රහයන් ඉදිරිපත් වී ඇත.

**නිගමනය**

අනාදිමත් කලෙක පටන් කර්මඵල විපාකය සම්බන්ධ මිනිස් වර්ගයාගේ පිළිගැනුම් සමගින් යහපත් අයහපත් ක්‍රියාවන් කෙරෙන් විපාක ලැබෙන ස්වර්ග හා නිරය යන සංකල්පයන් ආගමික සාහිත්‍යයන් කෙරෙන් ඊට අනන්‍ය වූ ලක්ෂණයන් කෙරෙන් අර්ථනිරූපණය වන්නට විය. දේවකේන්ද්‍රවාදය හා පුද්ගලකේන්ද්‍රවාදය එහි ලා වෙසෙසින් බලපෑ බව කිව යුතු ය. මෙහි ලා බුදු සමය හා ඉස්ලාම් ආගම යන ආගමික සංයෝජනය සලකා බැලීමේ දී කර්මය හා නිරය (නාර්) පිළිබඳ ආගම් ද්විත්ත්වයෙහි ඉගැන්වීම් විවිධ සමවිසමතාවන් සහිතව ඉදිරිපත් වන නමුදු එකී ඉගැන්වීම් තුලනාත්මකව අධ්‍යයනය කළ හැකි බවට නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පදඃ** ඉබාදත් ක්‍රියා, කර්මය, කුසලාකුසල, නිරය, නාර් සංකල්පය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අල්- කුර්ආන් අර්ථකථනය.* (2014) කොළඹඃ දාරුල් ඊමාන් අරමුදල,

*පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථාඃ* තුන්වැනි කොටස (2009). (පරි.) දයා ගුණසේකර. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිම නිකායඃ* තෘතීය භාගය (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා.

ෆස්නි, එච්.එම්. (1994).*ඉස්ලාම්.* ගාල්ලඃ සරසවි මුද්‍රණාලය සහ වෙළඳසැළ.

නන්ද හිමි, ඇකිරියගල (බු.ව. 2541). ''කර්ම සංකල්පයේ ඉතිහාසය'' *නිවන්මගඃ* කර්මය - 28 වන කලාපය, (සංස්.) චන්ද්‍රතිලක බුලත්සිංහල, කොළඹඃ රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය.